


පී. ඩී. ඊ. යශේලි ගෝනගල

# අක්කාගේ ආදරය

**කතෘ : ජී. ඒ. ඊ. යෂේලි ගෝනගල**

**කතෘගේ වෙනත් කෘති:**

**පුංචි දෝණී මං**

**2020 නොවැම්බර්**




**මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර**

**5 වසර - C**

**ISBN: 978-624-208-448-0**

## පිදුම

අප සැමට අනාගත බලාපොරොත්තු ඇත...

ඒවා සැබෑකර ගැනීමට නම්

අප වෙර දැරිය යුතුය...

ඒ කටුක මාවතේ මා ළඟින්ම සිටිනා

ආදරණීය අම්මාටත්, අප්පච්චිටත්...

මා යහ මඟට යොමු කරනා

ආදරණීය ගුරු මෑණිවරුන්ට හා

පියවරුන්ටත්...

මහ මෙරක් බඳු වූ ආදරණීය

මහාමායා විදු මවටත් ....

සෙනෙහසින් පුදමි...!

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුල පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සි මාහාපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන “හෙරණගත්කරණි” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.




එක ගමක හරිම දුප්පත් පවුලක් ඉතා සතුටින් ජීවත් වුණා. මේ ගෙදර සිටියේ අම්මයි, තාත්තායි, අක්කයි, මල්ලීයි. අක්කාගේ නම මිහිරි වන අතර මල්ලිගේ නම තරිඳු ය.



අම්මාත්, තාත්තාත් කුළි වැඩ කර මේ අයගේ බඩගින්න නිවා දැමුවා. කොතරම් අගහිඟකම් තිබුණත් ඔවුන් තම දරුවන්ට කිසිදු අඩුපාඩුවක් නොවන්නට වගබලා ගත්තා.



මෙසේ සතුටින් කාලය ගෙවීයද්දී එක් දිනක විශාල සුළි කුණාටුවක් ගම හරහා හමා ගියා. මේ නිසා මහා විපතකට ගම් වැසියන්ට මුහුණ දෙන්නට සිද්ධ වුණා.



සමහර අයට ගෙවල් දොරවල් අහිමි වුණා. තවත් සමහර අයට පවුලේ සාමාජිකයන් අහිමි වුණා. අනේ... ඉතින් මේ අක්කාටත් මල්ලීටත් තම දෙමව්පියන් අහිමි වුණා. මොවුන් දෙදනා තවත් අසරණ තත්වයට පත් වුණා.



මිහිරිත්, තරිඳුත් ඉගෙනීමට ඉතා දක්ෂයි. එසේම විෂය බාහිර ක්‍රියාකාරකම් වලිනුත් මුල්තැන ගත්තා. ඔවුන් දෙදෙනා පාසලේ කැපී පෙනෙන චරිත දෙකක්. එනමුත් සිදුවූ විපතෙන් කාගෙන්වත් පිහිටක් නැති මොවුනට පාසලෙන් සමු ගැනීමට සිද්ධ වුණා.



තරිඳු නිතර ගමේ පාසලේ වැට කොණට වී අනිත් ළමුන් දෙස හැඬු කඳුලින් බලා සිටියා. මිහිරි තම සොයුරාට හරිම ආදරෙයි. ඇය පාසැල් නොයන තම සොයුරා දෙස බලා සිටියේ හරිම දුකෙන්.



මිහිරි තම උත්සාහය අත්හැරියේ නැහැ. “මම කොහොම හරි මල්ලිට උගන්වලා හොඳ උගතෙක් කරමි” යැයි අධිෂ්ඨාන කර ගත්තා. ඇය ගමේ නිවසකට ගොස් රෙදි මසන්නට තීරණය කළා. ලැබෙන මුදලින් තම සොයුරා නැවත පාසලට ඇතුලත් කළා. තරිඳුටත් හරිම සතුටුයි. මවක නැති ඔහුට අක්කා මවක විය.



තරිඳු හොඳින් ඉගෙන ගන්නා අතර මිහිරි තම ආදායමෙන් කොටසක් ඉතිරි කර ගනිමින් මහන මැෂිමක් මිලදී ගත්තා. දැන් ඇය රෙදි මහන්නේ තම නිවසේදීමයි. ඒ නිසා තම සොයුරාටද පාසැල් වැඩට උදව් කරන්නට ඇයට කාලය ඉතිරි වුණා. ඒ වගේම මිහිරිටත් තම අධ්‍යාපන කටයුතු නැවත පටන් ගැනීමට අවස්ථාව ලැබුණා. උසස් පෙළ විභාගයට මුහුණ දුන් ඇය ඉතා හොඳින් සමත් වුණා.




මිහිරි තවත් මිතුරියන් දෙදෙනෙකු සේවයට බඳවා ගනිමින් කුඩාවට ඇඟළුම්හලක් පටන් ගත්තා. ඇගේ අවංකකමත්, නොපසුබස්නා උත්සහයත් නිසා මෙම ඇඟළුම්හල ක්‍රමයෙන් දියුණුවන්නට පටන් ගත්තා.



තරිඳු දැන් ලොකු ළමයෙක් ගණිත අංශයෙන් උසස්පෙළ විභාගයට පෙනී සිටි ඔහු ඉතා ඉහලින් එය සමත් වුණා. මෙසේ කාලය කෙමෙන් ගෙවි ගියා. මිහිරි දැන් විශාල ඇඟලුම් හලක හිමිකාරිණියක්.තරිඳු ඉංජිනේරුවරයෙක්.ඒත් සහෝදර බැඳිම තාමත් එලෙසමයි. ඒ අය ගොඩක් සතුටින් බොහෝ කාලයක් ජීවත් වුණා.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාගයයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරිමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දැවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.


ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක.
සෙනෙවිරත්න මහලේකම්


ISBN: 978-624-208-448-0